**හරිත වියන වියුණු අඩවිය**
**හරිත කවය**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

## ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනා සඳහා මාර්ගෝපදේශ

හරිත වියන වියුණු අඩවියෙහි පළ කිරීම සඳහා ඔබේ ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනා එවීමේ දී පහත මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වේ.

1. ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනා පරිසරය හා සබැඳි තේමාවක් ඔස්සේ ඉදිරිපත් විය යුතු ය. එහිදි පරිසරය හා සබැඳි කාලීන තේමා වෙත වැඩි ප්‍රමුඛතාවක් ලැබේ.

2. ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනා සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැකි ය.

3. ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනයක මුළු වචන සංඛ්‍යාව වචන 1000 කට නො වැඩි විය යුතු ය.

4. ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනයට උචිත පාඨකයින් ආකර්ෂණය කරගැනීමට සමත් තේමාවක් ඉදිරිපත් කළ යුතු ය. එම තේමාව දීර්ඝ නොවිය යුතු අතර සිංහල රචනයක් නම් එහි එහි ඉංග්‍රීසි පරිවර්තනය ද ඉදිරිපත් කිරීමට යෝජනා කෙරේ.

5. ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනය අතරතුර උපශීර්ෂ යටතේ කරුණු ගොනු කිරීමට අවස්ථාව ඇත.

6. සිංහල රචනා යුනිකෝඩ් භාවිතයෙන් ද ඉංග්‍රීසි රචනා සරල ඉංග්‍රීසි අකුරු මෝස්තරයක් භාවිතයෙන් ද සකස් කළ යුතු වේ.

7. ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනයට උචිත රූපයක් හෝ රූප උපරිම 03 ක් ඉදිරිපත් කළ හැකි ය. එම රූප ස්වනිර්මාණ නම් වඩාත් යෝග්‍ය වන අතර අන්තර්ජාලයෙන් හෝ වෙනත් මූලාශ්‍රයකින් ලබා ගන්නේ නම් එම මූලාශ්‍ර පැහැදිලි ව සඳහන් කළ යුතු වේ.

8. ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනයට පාදක කරගන්නා ආශ්‍රිත ග්‍රන්ථ සහ සටහන් මූලාශ්‍ර වශයෙන් අවසානයේ දී දක්වා තිබිය යුතු ය.

9. ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනය තුළ භාෂාව මැනවින් භාවිත කළ යුතු අතර අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණය වැනි කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු වේ.

10. ඉහත මාර්ගෝපදේශවලට අනුගත ව ඉදිරිපත් කරනු ලබන ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක රචනා සඳහා හරිත වියන සංස්කාරක කමිටුවෙහි අධීක්ෂණයට යටත් ව හරිත වියන වියුණු අඩවියෙහි පළ කිරීමට අවස්ථාව ලැබෙනු ඇත.